**කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව - 2020**

**------------------------------------**

## **1. මූල්‍ය ප්‍රකාශන**

**-------------**

### **1.1. තත්ත්වාගණනය කළ මතය**

**---------------------------**

කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### **1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### **1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**--------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පතනේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1. ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාහන අලුත්වැඩියාව වෙනුවෙන් දරන ලද රු.467,350 ක පුනරාවර්තන වියදම මෝටර් රථ හා කරත්ත යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුලදී හා පසුගිය වර්ෂයේදී විවිධ වැඩ සටහන් යටතේ සභාව සතු ඉඩම් ගොඩනැඟිලි සංවර්ධන සඳහා දරන ලද රු.4,467,875 ක වියදමක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | | |
| (ඇ) | ඉකුත් වර්ෂය අවසාන වන විට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් දායක මුදලට ගෙවිය යුතු රු.1,806,583 ක ශේෂය වෙනුවෙන් ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලස්වා නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාල රු.33,539 ක් වූ ගෙවිය යුතු ඉන්ධන වියදම් සඳහා ණයහිමි ප්‍රතිපාදන සලස්වා නොතිබුණි. | | |

**1.6.2. නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

---------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 11 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.237,112,468 ක් හා උපයෝගී ලේඛන/ උපලේඛන අනුව වටිනාකම රු.212,479,237 ක් වශයෙන් රු.24,633,231 ක වෙනසක් විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.3 අවිනිශ්චිත ගිණුම්**

--------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවති රු.1,168,845 ක අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය සමාලෝචිත වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ වන තෙක් නිරවුල් කිරීමට නොහැකි වී ඇති බව. | ඒ පිළිබඳ සොයා බලා අවශ්‍ය ගැලපීම් කර අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතුය. |

**1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

----------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.164,260,006 ක් වූ ගිණුම් විෂයයන් 07 කට අදාලව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | දීර්ඝකාලීන ගැටළු නිරාකරණය කරගනිමින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

--------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.31,663,085 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ අදායම රු.28,188,811 ක් විය.

**2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,139,304 ක හිඟ වරිපනම් බදු ශේෂයක් පැවතුණි. | කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් ජංගම සේවා පවත්වා හිඟ | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | මුදල් අය කර ගත නොහැකි බව. | |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.341,014 ක් අක්කර බදු හිඟව පැවතුණි. | කොරෝනා වසංගත තත්වය හේතුවෙන් අක්කර බදු සමීක්ෂණ කටයුතු සිදු කළ නොහැකි වූ බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,404,659 ක් හිඟ කඩ කුලී ශේෂයක් පැවතුණි. | කොරෝනා වසංගත තත්වයන් හේතුවෙන් ව්‍යාපාර ස්ථාන වසා තැබීම නිසා මුදල් අය කර ගැනීමේ ගැටලු පැවතීම | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------ | ----------------------- | ---------- |
| (අ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභා බල ප්‍රදේශයේ පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා නොගත් ආයතන 43 ක් පැවති අතර එම ආයතන මගින් පරිසරයට වන හානිය පිළිබඳව සභාවේ අවධානය යොමුවී නොතිබුණු අතර, බලපත්‍ර ගාස්තු වශයෙන් රු. 189,200 ක් සභාවට අය වී නොතිබුණි. | පරිසර බලපත්‍ර ලබාදිය යුතු ආයතන සඳහා බලපත්‍ර ලබා දීමට පියවර ගෙන ඇති බවත්, බලපත්‍ර ලබා නොදුන් ව්‍යාපාර සඳහා ඉදිරි කාලයේ දී බලපත්‍ර ලබා දීමට පියවර ගනු ලබන බව. | කඩිනමින් පරිසර බලපත්‍ර ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභා බල ප්‍රදේශයට අයත් අක්කර 14 රූඩ් 01 පර්චස් 14.1 ක්වූ ඉඩම් 04 ක් වෙන්දේසි කිරීමේ දී විකුණුම් වටිනාකමින් සියයට එකක ගාස්තුව වශයෙන් රු.597,731 ක් අය කර තිබුණ ද ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලියාපදිංචි කරන ලද ඔප්පුවල සඳහන් විකුණුම් වටිනාකම් සැලකිල්ලට නොගෙන තක්සේරු වටිනාකම් පදනම් කර ගෙන ගාස්තු අය කර තිබුණි. | විකිණීමට යෝජිත පිඹුරුපත් සැලැස්ම සඳහා අනුමැතිය ලබාදීමට පෙර ඔවුන් විසින් ඉදිරිපත් කරනු ලබන තක්සේරු වාර්තාවට අනුව අය කිරීම සිදු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ සේවක ණය ලේඛනය අනුව වාරික ගෙවීම් පැහැර හැර ඇති නිලධාරීන් හා සේවකයින් 19 දෙනෙකුගෙන් අයවිය යුතු රු.237,026 ක් වූ හිඟ ණය ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | අය නොවන සේවක ණය අයකර ගැනීමට කටයුතු කරන බව | සේවක ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |